සුවෙන් පෙරට

eඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ

Zonal Education Office - Minuwangoda

වාරය - II

| | | |
|---|---|---|
| ශ්‍රේණිය : 6 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 10 පාඩම<br>වාක්‍ය නිර්මාණය |

## වාක්‍යය නිර්මාණය

සරල වාක්‍යයක මූලික අංග තුනක් ඇත.ඒවා නම්,

(1) උක්තය
(2) කර්මය
(3) ආඛ්‍යාතය (අවසාන ක්‍රියාව)

ළමයා → උක්තය

පොත → කර්මය

කියවයි. → ආඛ්‍යාතය (අවසාන ක්‍රියාව)

- වාක්‍යයක අවසාන ක්‍රියාව කරන්නා උක්තය ලෙස හඳුන්වයි.
- වාක්‍යයේ අවසාන ක්‍රියාවට යටත්වන පදය කර්මය ලෙස හඳුන්වයි.
- උක්තය විසින් කරනු ලබන ක්‍රියාව ආඛ්‍යාතය ලෙස හඳුන්වයි.

ඇතැම් වාක්‍යවල කර්මයක් නැත. එහෙත් අර්ථය පැහැදිලිය.

උදාහරණ:-

1. සඳ පායයි.
2. මල් පිපෙයි.
3. ගඟ ගලයි.

මෙවැනි කර්මයක් නැති වාක්‍යය "අකර්මක වාක්‍ය" ලෙසත්, කර්මය සහිත වාක්‍යය "සකර්මක වාක්‍ය " ලෙසත් හැඳින්වේ.

- වාක්‍යය නිර්මාණයේ දී සම්මත රටා කිහිපයක් ඇත. ඒවා මෙසේය,

1. වාක්‍යයක උක්තය ප්‍රාණවාචී ඒක වචන නම් ආඛ්‍යාතය ද ඒක වචන වෙයි.

   උදා:- ළමයා පාඩම් කරයි.

   ගුරුවරයා අකුරු උගන්වයි.

   ඉහත වාක්‍යයවල ළමයා, ගුරුවරයා යන ප්‍රාණවාචී ඒක වචන නාම පද උක්ත වී ඇති නිසා කරයි, උගන්වයි යන ඒක වචන ආඛ්‍යාත යොදා ඇත.

2. වාක්‍යයක උක්තය ප්‍රාණවාචී බහු වචන නම් ආඛ්‍යාතය ද බහු වචන වෙයි.

   උදා:- ළමයි පාඩම් කරති.

   ගුරුවරු අකුරු උගන්වති.

   ඉහත වාක්‍යයවල ළමයි, ගුරුවරු යන ප්‍රාණවාචී බහු වචන නාම පද උක්ත වී ඇති නිසා කරති, උගන්වති යන බහු වචන ආඛ්‍යාත යොදා ඇත.

3. වාක්‍යයක උක්තය අප්‍රාණවාචී ඒක වචන වුවත් බහු වචන වුවත් ආඛ්‍යාතය ඒක වචන වෙයි.

   උදා:- තරුව අහසේ දිලෙයි.

   තරු අහසේ දිලෙයි.

   ඉහත වාක්‍යයවල උක්තය තරුව ලෙස අප්‍රාණවාචී ඒක වචනයෙන් යොදා තිබුණත් තරු ලෙස අප්‍රාණවාචී බහු වචනයෙන් යොදා තිබුණත් ආඛ්‍යාතය දිලෙයි ලෙස ඒක වචනයෙන් යොදා ඇත.

4. වාක්‍යයක උක්තයේ පුරුෂය අනුව එම වාක්‍යයේ ආඛ්‍යාතය ද එම පුරුෂයෙන් ම යෙදෙයි.ඒක වචන බහු වචන භේදය අනුව පුරුෂ තුනෙහි ම ආඛ්‍යාත නිර්මාණයවන ආකාරය පහත සඳහන් වේ.

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| උත්තම පුරුෂ | මම ගී ගයමි. | අපි ගී ගයමු. |
| මධ්‍යම පුරුෂ | තෝ ගී ගයහි.<br>නුඹ ගී ගයහි. | තොපි ගී ගයහු.<br>නුඹලා ගී ගයහු |
| ප්‍රථම පුරුෂ | ඔහු ගී ගයයි.<br>දරුවා ගී ගයයි.<br>දැරිය ගී ගයයි. | ඔවුහු ගී ගයති.<br>දරුවෝ ගී ගයති.<br>දැරියෝ ගී ගයති. |

- අතීත හා අනතීත යන කාල අනුව ද වාක්‍ය නිර්මාණ සකස් විය හැකිය.

උදා:- මම පාසල් යමි. / යන්නෙමි. - අනතීත කාල

මම පාසල් ගියෙමි. - අතීත කාල

➢ පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

01. හිස් තැනට ගැළපෙන උක්ත පද වරහන් තුළින් තෝරා ලියන්න.

(1).......................... පිට්ටනියේ සෙල්ලම් කළහ. (ළමයා / ළමයි)

(2).......................... ගොදුරු සොයා ඉගිලෙති. (කපුටෝ / කපුටන්)

(3).......................... පොත පාඩම් කළෙහි. (නුඹලා / නුඹ)

(4).......................... ගමට ගියෙමි. (මම / මා)

(5).......................... නැටුම් බලන්නට යමු. (අප / අපි)

02. හිස් තැනට සුදුසු කර්ම පද වරහන් තුළින් තෝරා ලියන්න.

(1) පූසෝ ............................ අල්ලති. (මීයන් / මීයෝ)

(2) රියදුරා ............................ සේදුවේ ය. (නඟුල / කාරය)

(3) කොකා ............................ ගිල දමයි. (මළුවෝ / මාළුවන්)

(4) වඩුවා ............................... සෑදුවේ ය. (පුටුව / වාහනය)

(5) මම ................................ නරඹමි.(රූපවාහිනිය / රේඩියෝව)

03. පහත වාක්‍යයවල උක්තයට සුදුසු ආඛ්‍යාත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(1) ගුරුතුමිය සතුටින් පාසලට ................................
(2) වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා ............................
(3) හංසයෝ දියෙහි ........................
(4) මයිනා අඹ ගෙඩියක් .....................
(5) ඔහු වාහනය ............................
(6) බල්ලෝ පාර දිගේ ......................
(7) මම අම්මාට ලිපියක් ................................
(8) තොපි අද පාසල් ...........................
(9) ගුවන් යානා අහසේ පියාසර .......................

(10) නුඹ මල් පූජා ................................

04. පහත සඳහන් අනතීත කාල වාක්‍යය අතීත කාලයට හරවා ලියන්න.

(1) මිතුරියෝ තෑගි දෙති.
..........................................................................
(2) ගොවියෝ කුඹුරු කොටති.
..........................................................................
(3) ලේඛිකාව පොතක් ලියන්නී ය.
..........................................................................
(4) රජවරු වැව් සාදති.
..........................................................................
(5) ශිෂ්‍යයා දස්කම් දක්වන්නේ ය.
..........................................................................
(6) සතුරෝ සටනින් පරදිති.
..........................................................................
(7) මගියා බසයෙන් බසියි.
..........................................................................
(8) අපි පන්සලට යන්නෙමු.
..........................................................................
(9) හෙදියෝ රෝගීන්ට කරුණාවෙන් සලකති.
..........................................................................

(10) මම විභාගයෙන් ජය ලබන්නෙමි.

..........................................................................